34 වන පිටුවෙන්

සම්බන්ධයට මෙම සැමියා විරුද්ධ නොවීද? එසේනම් ඒ මන්ද? ඔහු කොන්දක් තිබූ සැමියෙකු නම් මෙම සම්බන්ධය දැනගත් වහාම පක්ෂයේ අයට තම නිවසට පැමිණීම තහනම් කළ යුතුය. බිරිඳත් පක්ෂයෙන් ඉවත් කරගෙන තමාද ඉවත් විය යුතුය. "මොරින්ගේ මිනිහා තමන්ගේ කැමැත්තෙන්ම විජේවීරට ගෑනු දුන්නාදැයි? " ග්‍රාම්‍ය භාෂාවෙන්ම අසන්නට සිදුවන්නේ මෙතැනදීය..

මොරින් රෝහණ සහෝදරයාට වස දීමට කරන ලද උත්සාහයක් ගැනත්, පොල්කිච්චා මැරී වැටුණු කථාවත් පක්ෂයේ නිර්මාණයක් යැයි සිතුවත් මොරින්ගේ සැමියාගේ ක්‍රියාකලාපයත් වරදේ පංගුකාරියක වූ ඇය විසින්ම පරීක්ෂණයක් ඉල්ලා සිටීමත් සැකයට බඳුන්වන කරුණු නොවන්නේද? එවැනි බරපතල වූ විනය කඩකිරීමකට රෝහණ සහෝදරයා වැරදි කාරයෙකු කිරීමෙන් පක්ෂය ඇතුළතින්ම මතුවන අර්බුදයකින් යම් පිපිරීමක් ඇති කිරීමට ඇය කාගේ හෝ සැලැස්මක කොටසක් ඉටුකළා විය නොහැකිද?

කෙසේවුව මෙම හෙළිදරව්වෙන් ලයනල් බෝපගේ නම් වූ චරිතයද හෙළි වේ. ලයියා මෙම හෙළිදරව්ව කරන්නේ පොල්කිච්චි කථාවෙන් ඇය බේරා මොරින්වද සාධාරණය ඉටුකිරීම පිණිසලු ! ඔහු මොරින්ට සාධාරණය ඉටුකළ හැටි නම් හරිම අපූරුය. ලයියා කරන ලද්දේ මැස්සාට කඩු පහරක් දී රජා මැරූ වඳුරාවත් අන්ත දොයකි. මොරින් ගැන මගේ කෘතියෙන් කළ සඳහනෙන් ඇයට යම් අවමානයක් සිදුවෙතොත් එය ජ.වි.පෙ. විසින් නිර්මාණය කළ අසත්‍ය පුවතක් යැයි කියා එම අවමානයෙන් මිදීමට ඇයට අවස්ථාවක් තිබුණි. නමුත් සුදු පිරුවටයක්ද අතැතිව මොරින් ළඟට පැමිණි ලයියා ඇගේ ඇඳි වත කරටම ඉස්සුවේය. (දැන් "ප්‍රමිලා බීසවගේ" කලුවයේ උපන් ලපය අන්තර්ජාලයේය.)

පිළිත්ව සිටී නම් මොරින්ද අද මැදි වයසේය. ඇයට දරු මුණුපුරන් සිටී නම් ඔවුන් අන්තර්ජාලයෙන් "සන්නස" පත්තරය කියවා සිය මවගේ, අත්තම්මාගේ "පැටිකිරිය" දැන ගතහොත් ඇයට සිදුවන ලැජ්ජාව ගැන ලයියා සිතා බැලුවාද?

මොරින් පසෙක සිටියේ වා ! ලයියා අඩුම තරමින් චිත්‍රාංග නී සොයුරියත්, විජේවීර සහෝදරයාගේ දරුවනුත් ගැන සිතා බැලුවාද? චිත්‍රාංගනී සොයුරිය මෙම සිද්ධිය දැන සිටියා යැයි සිතමු. එහෙත් ලක් ඉතිහාසයේ දැවැන්ත චරිතයක් වූ තම ගෞරවාන්විත පියා ගැන, ඔවුන්ගේ ලෝකයේ වීරයා ගැන මෙවැනි පාපතර කථාවන් අසන්නට ලැබීමෙන් එම දරුවන්ගේ සිත්වලට ඇතිවන තැවුල ගැන, කම්පනය ගැන හැඟීමක් ලයියාට තිබුණාද? මේ කථාව කියන්නේ රාගම කඳවුරට අප බැලීමට පැමිණි, අප ඕස්ට්‍රේලියාවට ගෙන යාමට පොරොන්දු වූ ලයනල් මාමා නොවේදැයි එම දරුවන් විශ්මයට පත් නොවනු ඇතිද? මම ලයියාගෙන් ප්‍රශ්නයක් අසමි. ඔබ චිත්‍රාංගනී සොයුරිය සහ දරුවන් ඕස්ට්‍රේලියාවට ගෙන්වා ගෙන දැන් ඔවුන් පදිංචිව සිටින්නේ ඔබලා පදිංචි ප්‍රදේශයේ යැයි සිතමු. ඔබ එවිටත් රෝහණ සහෝදරයා සම්බන්ධයෙන් වන මෙම කථාව හෙළිදරව් කරනවාද?

ලයියාගේ ලිපි පෙළ හොඳින් අධ්‍යයනය කරන්නෙකුට ඔහුගේ හිතේ විජේවීර සොයුරා ගැන සඟවා ගත් වෛරයක් ඇතැයි නොවැටහීමට කාරණයක් නැත. ලයනල් බෝපගේ යන චරිතයටද යම් වටිනාකමක් ලැබුණේ ඔහු රෝහණ විජේවීර යන දැවැන්ත චරිතය ළඟ සිටී තාක් කල් පමණි. විජේවීරට ගැරහීමෙන් සිදුවන්නේ ලයියා තව තවත් මිටිවීමය.

ජ.වි.පෙ. කෘතියේ ඇත්තේ මව්සින් පබඳින ලද කථා නොවේ. ජ.වි.පෙ. ඉතිහාසයට අයත්ව පවතින කථාය. එහෙත් ලයියා කියන්නේ ඒවා ඕපාදූප ඇසුරින් මා ලියූ දේවල් බවය. එසේ කියන ලයියා, මා ලියූ දේවල් බොරු නොවන බව ඔහුම තහවුරු කරයි. එයට හොඳම උදාහරණයක් ලෙස ලයියාගේ 5 වැනි ලිපියේ අවසාන කොටස කියවීම වුව ප්‍රමාණවත්ය.

32 වන පිටුවෙන්

ලද අයට පවා ජීවත් වන්නට සරිලන තරම් රැකියාවක් ලබා ගත නොහැකි වාතාවරණයක් තුල අවමානයට, අනාරක්ෂිතභාවයට සහ අපේක්ෂා භංගත්වයට භාජනය වූ ජන ප්‍රජාවන්, විශේෂයෙන්ම රටේ තරුණ කොටස්, එම තත්වයන් විසින්ම ආයුධ සන්නද්ධව නැගී සිටින්නට පොළඹවන ලද බව මෙයට පෙර පළ කල ලිපි මගින් පෙන්වා දුන්නෙමි. තමන් සන්තකව පවතින දේශපාලන අනුග්‍රහය සහ ආර්ථික බලය ගිලිහෙන්නට නොදී එම බලය ප්‍රචණ්ඩ ලෙස රඳවා ගෙන සිටින පාලක ප්‍රභූ පැලැන්තියට එරෙහිව නව සමාජ බල වේග විප්ලවකාරී ලෙස පෙල ගැසෙන්නේ මේ නිසාය. ඇති නැති අය අතර පවතින පරතරය අඩු වී යන ආකාරයෙන් කටයුතු කිරීමෙන් ද, රටේ අධ්‍යාපන සහ ආර්ථික ප්‍රතිපත්ති එකට පෙළ ගැස්වීම මගින් ද, විශේෂයෙන්ම රටේ උසස් අධ්‍යාපනය ලබා පිට වී යන තරුණ කොටස් වල දක්ෂතා සහ නිපුණතාවයන් (abilities and competencies) සහ රටේ ආර්ථික සංවර්ධනය විසින් ඇති කරනු ලබන ඉල්ලුමේ අවශ්‍යතාවයන් එකට පෑහීමෙන් මෙම ගැටුම් කාරී වාතාවරනය බොහෝ දුරට සමනය කළ හැකි බව මගේ අදහස යි.

තව ද, ලංකාවේ විශ්ව විද්‍යාල වලින් වෛද්‍ය, දන්ත සහ පශු වෛද්‍ය, ඉංජිනේරු සහ කෘෂිකර්ම වැනි උපාධි ලබා ගත් සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් රටේ සහ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට තිබෙන පහසුකම් සහ ලැබෙන අවස්ථාවන් වල විරල භාවය නිසා හෝ තමන්ගේ පුද්ගලික සමාජ ආර්ථික අවශ්‍යතාවයන් නිසා හෝ විදේශගතව සිටින බව පෙන්වා දුන්නෙමි. ජපානය, මහජන චීනය, කොරියාව වැනි රටවල ආර්ථික ක්ෂේත්‍රයේ ඉදිරියේ ඇති වන අවස්ථා තක්සේරු කොට ඒ අනුව උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි පර්යේෂණ වැඩ සටහන් සකස් කර ගැනීම මගින් ද, දශක හතරක් තිස්සේ ඇමෙරිකන් රජයේ ආර්ථික තහංචි වලට ලක්ව සිටින කියුබාව වැනි රටවල් දිගු කාලයක් මුළුල්ලේ තම රටේ අනාගත අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය දක්ෂ සහ අවශ්‍ය පුහුණුව ලත් ගුරුවර ගුරුවරියන් ද, වෛද්‍ය සහ අනෙක් සෞඛ්‍ය සේවක සේවිකාවන් ද උත්පාදනය කොට ගන්නේත් මේ ආකාරයෙන් ආර්ථික ඉල්ලුම සහ අවස්ථා සැපයුම සමබර ලෙස පවත්වා ගැනීමෙනි.

අප සාකච්ඡා කරමින් සිටි අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් ලංකාවට සාපේක්ෂව ගත් විට ක්‍රියාත්මක කළ හැක්කේ කුමන ආකාරයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග දැයි යන්න මීළඟ ලිපියෙන් පැහැදිලි කරන්නට උත්සාහ කරමි.

නිවාස සහ ඉඩකඩම් නවීකරණය කරගැනීමට

ඔබ සිතනවාද?

SETSQUARE PROPERTY
DEVELOPMENT

ARCHITECTURAL DESIGNS FOR

- Subdivisions (Make use of your Large Backyard)
- New Homes/Units Development Plans
- Extensions and Renovations

COVERS ALL SUBURBS
For Obligation Free Consultations

Contact - Asanka Jayawardena
Mob : 0402 443 554 Tp : 9323 7393
asankapj@gmail.com

විදර්ශනා

කොහෙදෝ ඈතක ඉඳළා
ඉඟිළී ආ සමිනළයෝ
ළතාවකට - රටාවකට
හනි හනිකට සාදුකාර
දී යන හැටි බලන් ඉන්න
ආසයි වන පෙතක් මැදින්
ගලා හැළෙන දිය දහරින්
එහාට යන හැටි ලස්සන
මල් වැල් තුරු ගොමු අතරින්.....

සිත සතුටින් පිරී ගියා
හද විළ කිමිදී කිමිදී
ගත සිසිලෙන් තෙමී ගියා
සුන්දරත්වයේ පහසින්

සනහන්නට
උපන් හැඟුම්
නිසල නිහඬ
ගොළුවත රැකි
සොඳුරු හදක
පහස පතා
ආවෙමි භව කතර ගෙවා

සංසාරේ පුරුද්දකට
නිවනට යන ගමන් මගේ

රඟ දෙන හැඩ නරඹන්නට
නරඹන හැඩ පවසන්නට
පවසන හැඩ විඳගන්නට
විඳගෙන අපි බුදුවෙන්නට
ආදරයට ආදරයෙන්
හැඟදාකම ළංවීගෙන
නිවනට යන ගමන් මගේ
මා ඔබටත්
ඔබ මටමත්
හුළු අත්තක් වෙමින් ඉතිං....

එකල උන්නු
නකුළ යුවළ
ඉපිද මැරෙන සංසාරේ
එකට ඉපිද
එකටමැ ඉඳැ
එකටම දුටු
නිවන නිවුනු
මෙකල දකින
යුවළද අපි

පුරහඳ රුව
වසනා වළා
අකීකරුය
කෙහෙරැළි

වසනා සඳ පෙනෙනා
යළි වසනා'යුරු කදිමා

සුළඟට
සෙළවෙන ලෙසා
තුරු නගනා
හඬ විළසා
ඇසෙනා සුසුමන් නෑසී
යළි ඇසෙනා'යුරු රමණා

ගොයමා වැනි
රඟනා
සියුමැළි අත් සැළෙනා
ඉඟි බිඟි
පානා අතරා

කළඹන
වස්තුව මිනිසුන්
කුමකටදෝ දැන් මට ?

මගේ ළඟින්
මගේම වී
මා මිය යන තුරා නිබඳ
සඳවතියක් මා රකිනව

සසර කතර ගෙවන
අතර
නතර වීද අතර මගක
දුර පාරක කතර අතර

අහු-මුලු කලු අඳුරු පැහැති
බලා ගන්න හුළු අත්තක්
වෙන්න හැකිද ආදරයට... ?

විශ්මව මම බලා හිඳිමි
විශ්වය නොපෙනෙන දිග - උස
ඈත ඈත අනන්තයේ
නොදැනෙන නෙපෙනන අනේක
සහසක් තරු දිළෙන රැඳක
සිරිය පිරිය සිතක පුදුම !

මෙතරම් කෙතරම් විසාල
විශ්වයකද මා ඉන්නේ
පරමාණුව වගේ පුංචි
මේ සරීර කුඩුව තුළ
ඉන්න මගේ තරම නේද
අපමණ තරමට විසාල !

සතුට සොයා යයි ඉඟිළී
විදා පියා පත් සැනෙකින්
උඩු ගුවනට - අනන්තයට
නිරන්තරේ සැනසිල්ලෙන්

ආකාසේ සැඟවීලා
පොළෝ තළය දෙස බලාන
බවුන් වඩන්නට සිතකට
ඇත්නම් -
එය මොන පිනක්ද !

ජීවිතයේ වේදිකාවේ

කෙළවර ඒ නිවන ඇත්ද...

ඈ වත නිගුලුල් මලකි
පියයුරු රස අඳුනක් වී
නිතඹ ලතාවකට නැළවී
පයතබනා යුරු සොබනා
බැස යන ගංගා කොමළී

තුරුහිමි තුරුළට තුරුශුව
ලතා ලතා ලබැඳුනු ලීලා
නැළැවෙන වැළැපෙන සැනසෙන
සුන්දර ආදර ගීතේ
පදපෙළ අතරින් ගලනා
සරිගම-පදනි තාලේ
මත්වී රඟනා බඹරෝ
මෙලෝ එලෝ එකටම වසතී

වීරාමය ....

සාමන්ත තැන්නගේ